බුදුසරණ

2016 පෝය ලබන ගෙවෙන වේලාවන් සහ සිල් සමාදන් වියයුතු දවස්

උඳුවප් මස පෝය										
ජන. 01	සිකුරා	අ.හා.	09.38 න්	අව අටවක ලබා	03 ඉරිදා	පූ.හා.	00.22	න් ගෙවේ.	සෙන. සිල්
ජන. 09	සෙනසු	පූ.හා.	07.53 න්	අමාවක ලබා	10 ඉරිදා	පූ.හා.	07.00	න් ගෙවේ.	සෙන සිල්
දුරුතු මස පෝය									
ජන. 16	සෙනසු	අ.හා	05.55 න්	පුර අටවක ලබා	17 ඉරිදා	අ.හා.	03.57	න් ගෙවේ.	සෙන සිල්
ජන. 23	සෙන	පූ.හා.	07.31 න්	පසළොස්වක ලබා	24 ඉරිදා	පූ. හා	07.15	න් ගෙවේ.	සෙන සිල්
ජන. 31	ඉරිදා	අ.හා.	07.43 න්	අව අටවක ලබා	පෙ.01 සඳුදා	අ.හා.	10.05	න් ගෙවේ.	සඳුදා සිල්
පෙබ. 07	ඉරිදා	අ.හා.	10.20 න්	අමාවක ලබා	08 සඳුදා	අ.හා.	08.08	න් ගෙවේ.	සඳුදා සිල්
නවම් මස පෝය									
පෙබ. 15	සඳුදා	පූ.හා.	02.11 න්	පුර අටවක ලබා	16 අඟහ	පූ.හා.	00.06	න් ගෙවේ.	සඳුදා සිල්
පෙබ. 21	ඉරිදා	අ.හ	10.34 න්	පසළොස්වක ලබා	22 සඳුදා	අ.හා	11.49	න් ගෙවේ.	සඳුදා සිල්
මාර්තු. 01	අඟහ	අ.හා	03.51 න්	අව අටවක ලබා	02 බදදා	අ.හ	05.19	න් ගෙවේ.	අඟහ සිල්
මාර්තු. 08	අඟහ	පූ. හා	10.34 න්	අමාවක ලබා	09 බදදා	පූ. හා	07.24	න් ගෙවේ.	අඟහ සිල්
මැදින් මස පෝය									
මාර්. 15	අඟහ	පූ.හා	11.12 න්	පුර අටවක ලබා	16 බදදා	පූ. හා	10.03	න් ගෙවේ.	අඟහ සිල්
මාර්. 22	අඟහ	අ.හා.	03.12 න්	පසළොස්වක ලබා	23 බදදා	අ.හා	05.30	න් ගෙවේ.	අඟහ සිල්
මාර්තු. 31	බ්‍රහස්	පූ.හා.	08.28 න්	අව අටවක ලබා	අප්‍රේ.01 සිකු.	පූ. හා	08.53	න් ගෙවේ.	බ්‍රහස් සිල්
අප්‍රේල්. 06	බදදා	අ.හා	08.36 න්	අමාවක ලබා	07 බ්‍රහස්.	අ.හා	04.53	න් ගෙවේ.	බ්‍රහස් සිල්
බක් මස පෝය									
අප්‍රේල්. 13	බදදා	අ.හා	09.41 න්	පුර අටවක ලබා	14 බ්‍රහස්	අ.හා	09.29	න් ගෙවේ.	බ්‍රහස් සිල්
අප්‍රේ. 21	බ්‍රහස්	පූ.හා	08.20 න්	පසළොස්වක ලබා	22 සිකුරා	පූ.හා	10.53	න් ගෙවේ.	බ්‍රහස් සිල්
අප්‍රේ. 29	සිකුරා	අ.හා	09.10 න්	අව අටවක ලබා	30 සෙන	අ.හා	08.36	න් ගෙවේ.	සෙන සිල්
මැයි. 06	සිකුරා	පූ.හා	04.47 න්	අමාවක ලබා	07 සෙනසු	පූ.හා.	00.59	න් ගෙවේ.	සිකුරා සිල්
වෙසක් මස පෝය									
මැයි. 13	සිකුරා	පූ.හා.	10.10 න්	පුර අටවක ලබා	14 සෙනසු	පූ.හා.	11.05	න් ගෙවේ.	සිකුරා සිල්
මැයි. 21	සෙන.	පූ.හා.	12.42 න්	පසළොස්වක ලබා	22 ඉරිදා	පූ. හා	02.44	න් ගෙවේ.	සෙන සිල්
මැයි. 29	ඉරිදා	පූ.හා	06.18 න්	අව අටවක ලබා	30 සඳුදා	පූ.හා.	04.57	න් ගෙවේ.	ඉරිදා සිල්
ජූනි. 04	සෙන	පූ.හා	11.49 න්	අමාවක ලබා	05 ඉරිදා	පූ.හා.	08.29	න් ගෙවේ.	සෙන සිල්
පොසොන් මස පෝය									
ජූනි. 12	ඉරිදා	පූ.හා	00.48 න්	පුර අටවක ලබා	13 සඳුදා	පූ.හා	02.39	න් ගෙවේ.	ඉරිදා සිල්
ජූනි. 19	ඉරිදා	අ.හා.	03.31 න්	පසළොස්වක ලබා	20 සඳුදා	අ.හා.	04.32	න් ගෙවේ.	ඉරිදා සිල්
ජූනි. 27	සඳුදා	අ.හා.	12.44 න්	අව අටවක ලබා	28 අඟහ.	පූ. හා.	10.47	න් ගෙවේ.	සඳුදා සිල්
ජූලි. 03	ඉරිදා	අ.හා	06.53 න්	අමාවක ලබා	04 සඳුදා.	පූ. හා.	04.30	න් ගෙවේ.	සඳුදා සිල්.
ඇසළ මස පෝය									
ජූලි. 11	සඳුදා	අ.හා.	05.12 න්	පුර අටවක ලබා	12 අඟහ.	අ.හා.	07.34	න් ගෙවේ.	සඳුදා සිල්
ජූලි. 19	අඟහ	පූ.හා.	04.40 න්	පසළොස්වක ලබා	20 බදදා	පූ.හා.	04.26	න් ගෙවේ.	අඟහ සිල්
ජූලි. 26	අඟහ	අ.හා.	05.36 න්	අව අටවක ලබා	27 බදදා	අ.හා.	03.21	න් ගෙවේ.	අඟහ සිල්
අගෝ. 02	අඟහ	පූ.හා.	03.14 න්	අමාවක ලබා	03 බදදා	පූ.හා.	02.14	න් ගෙවේ.	අඟහ සිල්
නිකිණි මස පෝය									
අගෝ 10	බදදා	පූ. හා.	10.39 න්	පුර අටවක ලබා	11 බ්‍රහස්	අ.හා.	12.59	න් ගෙවේ.	බදදා සිල්
අගෝ. 17	බදදා	අ.හා.	04.27 න්	පසළොස්වක ලබා	18 බ්‍රහස්	අ.හා	02.56	න් ගෙවේ.	බදදා සිල්
අගෝ. 24	බදදා	අ.හා.	10.17 න්	අව අටවක ලබා	25 බ්‍රහස්	අ.හා.	08.07	න් ගෙවේ.	බ්‍රහස් සිල්
අගෝ. 31	බදදා	අ.හා.	02.03 න්	අමාවක ලබා	සැප්. 01 බ්‍රහ.	අ.හා.	02.33	න් ගෙවේ.	බදදා සිල්
බිනර මස පෝය									
සැප්. 09	සිකුරා	පූ.හාග	04.19 න්	පුර අටවක ලබා	10 සෙන.	පූ.හා.	06.11	න් ගෙවේ.	සිකුරා සිල්
සැප්. 16	සිකුරා	පූ.හාග	03.15 න්	පසළොස්වක ලබා	17 සෙන	පූ.හා	00.35	න් ගෙවේ.	සිකුරා සිල්
සැප් 23	සිකුරා	පූ.හාග	04.19 න්	අව අටවක ලබා	24 සෙනසු	පූ.හාග	02.40	න් ගෙවේ.	සිකුරා සිල්
සැප්. 30	සිකුරා	පූ.හාග	03.55 න්	අමාවක ලබා ඔක්	01 සෙනසු	පූ.හා	05.41	න් ගෙවේ.	සිකුරාදා සිල්
වප් මස පෝය									
ඔක්. 08	සෙන	අ.හාග	09.24 න්	පුර අටවක ලබා	09 ඉරිදා	අ.හා.	10.31	න් ගෙවේ.	ඉරිදා සිල්
ඔක් 15	සෙන	අ.හාග	01.25 න්	පසළොස්වක ලබා	16 ඉරිදා	පූ.හා.	09.53	න් ගෙවේ.	සෙන සිල්
ඔක්. 22	සෙන	අ.හාග	01.10 න්	අව අටවක ලබා	23 ඉරිදා	අ.හා.	12.28	න් ගෙවේ.	සෙන සිල්
ඔක්. 29	සෙන	අ.හාග	08.40 න්	අමාවක ලබා	30 ඉරිදා	අ.හා.	11.08	න් ගෙවේ.	ඉරිදා සිල්
ඉල් මස පෝය									
නොවැ. 07	සඳුදා	අ.හා.	01.09 න්	පුර අටවක ලබා	08 අඟහ	අ.හාග	01.20	න් ගෙවේ.	සඳුදා සිල්
නොවැ. 13	ඉරිදා	අ.හා.	11.17 න්	පසළොස්වක ලබා	14 සඳුදා	අ.හා.	07.22	න් ගෙවේ.	සඳුදා සිල්
නොවැ. 21	සඳුදා	පූ.හා.	01.55 න්	අව අටවක ලබා	22 අඟහ	පූ.හාග	02.23	න් ගෙවේ.	සඳුදා සිල්
නොවැ. 28	සඳුදා	අ.හා.	03.20 න්	අමාවක ලබා	29 අඟහ	අ.හා.	05.48	න් ගෙවේ.	සඳුදා සිල්
උඳුවප් මස පෝය									
දෙසැ. 07	බදදා	පූ.හා.	02.50 න්	පුර අටවක ලබා	08 බ්‍රහස්	පූ.හා.	02.04	න් ගෙවේ.	බදදා සිල්
දෙසැ. 13	අඟහ	පූ.හා.	09.16 න්	පසළොස්වක ලබා	14 බදදා	පූ.හා.	05.35	න් ගෙවේ.	අඟහ සිල්
දෙසැ. 20	අඟහ	අ.හා.	06.43 න්	අව අටවක ලබා	21 බදදා	අ.හා.	08.17	න් ගෙවේ.	බදදා සිල්
දෙසැ. 28	බදදා	පූ.හා.	10.36 න්	අමාවක ලබා	29 බ්‍රහස්	අ.හා.	12.23	න් ගෙවේ.	බදදා සිල්

දෙළොස් මහා පොහොය දිනවල සිදු වූ ශාසනික වශයෙන් වැදගත් ඓතිහාසික සිදුවීම්

දුරුතු පසළොස්වක පොහොය

තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකා ගමනය සිදු වූයේ ඓතිහාසික දුරුතු පෝ දිනකය. තුන් බෑ ජටිලයන් ප්‍රධාන දහසක් සව්වන් සඳහම් මඟට හරවා ඔවුන් හැම අරි සඟ ගණ බවට පත්කොට වදාළ බුදුපියාණන් වහන්සේ අනතුරුව හෙළ දිව බිමී තැන්නේ මහවැලි ගඟ අසබඩ මිහිපේ නම් සරු දනව් පියසට ගුවන් ගැබින් පහළව සවනක් බුදුරැස් මාලාවන්ගෙන් දිලිහී වැඩහුන් සේක.

නවම් පසළොස්වක පොහොය

සැරියුත් මුගලන් දෙනම අගසව් තනතුරු ලබන ලද්දේ ද, සම්බුද්ධ ශාසනවංශ කතාවෙහි ප්‍රථම මහා සංඝ සන්නිපාතය සිදු වූයේ ද නවම් පුන් පොහෝ දිනකය.

මැදින් පසළොස්වක පොහොය

ලෝකාර්ථචර්යාවෙහි යෙදුණු බුදුන් වහන්සේ විසි දහසක් මහ සඟරුවන සමඟ රජගහනුවර සිට තමන් වහන්සේගේ උපන් ගම වූ කිඹුල්වත්පුරයට ගමනාරම්භ කළේ මැදින් පෝදාය.

බක් පසළොස්වක පොහොය

බුදුපියාණන් වහන්සේගේ මහා ගුණ කඳ මනසට නංවන අසිරිමත් දිනයකි බක් පොහොය දිනය මේ සුන්දර දිවයින දෙවැනිවරට ද බුදු සිරිපා පහසින් පිවිතුරු බවට පත් වූයේ ද, බුදුරජාණන් වහන්සේගේ සවනක් රැස් කඳින් නාගදීපය ආලෝකවත් වූයේ ද දහම් අමා මිහිරෙන් නොයෙක් දෙනා තිව් සැනසී ගියේ ද, බක් පුර පොහෝ දිනකදී ය.

වෙසක් පසළොස්වක පොහොය

තිලොවඟ සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ලොව පහළවීම, බුදුවීම, පිරිනිවන් පෑම යන අසිරිමත් මංගල කරුණු රැසකින් පූජනීයත්වයට, ඓතිහාසිකත්වයට පත්වුණු ශ්‍රී වෛශාඛ දිනය සමස්ත ලෝකවාසී බෞද්ධ ජනතාවගේ පරම පූජනීය දිනයයි.

පොසොන් පසළොස්වක පොහොය

අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ දඹදිව් තලයේ සිට හෙළ දිව් තලයේ මිස්සක පව්වට සඳහම් පණිවිඩය රැගෙන වැඩම කළ ඓතිහාසික දිනය පොසොන් දිනයයි.

දෙළොස් මහා පොහොය දිනවල සිදු වූ ශාසනික වශයෙන් වැදගත් ඓතිහාසික සිදුවීම්

ඇසළ පසළොස්වක පොහොය.

බරණැස ඉසිපතනාරාමයේ දී දුකත්, දුකට හේතුවත්, නිවනත්, එය ලබන පිළිවෙතත් යන සත්‍ය සතර ලොව පළමුවරට දේශනා කළ දිනයයි, ඇසළ පෝද.

නිකිණි පසළොස්වක පොහොය

ඇසළ අව පැලවිය ද භික්ෂූන් වහන්සේ පෙර වස් එළඹීමට නියමිත දිනයයි. නිකිණි පසළොස්වක පොහෝ ද පොහොය කොට නිකිණි අව පැලවිය ද පසුවස් එළඹීමයි සයුන් පිළිවෙත වන්නේ.

බිනර පසළොස්වක පොහොය

බුද්ධ නියමය අනුව භික්ෂූන් වහන්සේ විහාරාරාමයන්හි නිබඳව වැඩ වසමින් බණ භාවනාවල යෙදෙමින් ස්වකීය ශාසන පරමාර්ථ ඉටු කරගන්නා කාලයකි. මෙහෙණ සසුණේ ආරම්භය සිදු විය.

වප් පසළොස්වක පොහොය

වස්සාන සෘතුවේ මුල් තුන් මස භික්ෂූන් වස් වසා වැඩ සිටින කාලයයි. වස් සාර මාසයේ අන්තිම මාසය කඨින චීවර පූජා මාසයයි. එය චීවර මාසය නමින් ද ව්‍යවහාර කෙරේ.

ඉල් පසළොස්වක පොහොය

ශාසන ඉතිහාසයේ අනුස්මරණීය සිද්ධීන් කිපයකට මුල් වූ පොහොය දිනයකි. මෙතේ බෝසත්තුමා විවරණය ලැබීම, ප්‍රථම රහතන් වහන්සේ හැට නම ධර්ම ප්‍රචාරය සඳහා ගමන් ඇරඹීම පසුවස් පවාරණය කළ යුතු දිනය ද, සැරියුත් මහ රහතන් වහන්සේගේ පරිනිර්වාණය සිදුවීම ද යන කරුණු රැසක් අනුස්මරණය කැරෙන්නේ ඉල් පෝද, ය.

උඳුවප් පසළොස්වක පොහොය

උඳුවප් පොහොය දින සිදු වූ ශ්‍රී සංඝ මිත්තා මහරහත් මෙහෙණින් වහන්සේගේ ලංකාගමනය ගැන ලංකා මෙහෙණ සසුන ගැන, ජය ශ්‍රී මහා බෝ සමිඳුන් ගැන සිහි කරන කවර අයකුට වුව ද ඇති වනුයේ මහා සැනසිල්ලකි.

වර්ෂ 2016 ජනවාරි 02 වනදා සෙනසුරාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.